කම්කරු දෙපාර්තමේන්තුව
කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

# කෘෂි කර්මාන්තයේදී රසායනිකයන් සුරක්ෂිතව පරිහරණය කිරීම.

## අරමුණ

කෘෂි කාර්මික කටයුතු වලදී භාවිතා කරන රසායනික අඩංගු කෘමිනාශක, පළිබෝධනාශක හා පොහොර නිසා ඇතිවන අනතුරු හා රෝග වළක්වා ගැනීම



## අපේක්ෂිත ප්‍රතිලාභ

සුරක්ෂිත පරිසරයක්, නීරෝගී සේවක පිරිසක්, සෞඛ්‍ය ආරක්ෂිත සමාජයක්....

## ඔබ රසායනික සුරක්ෂිතතාවය පිළිබඳ දැන ගත යුත්තේ ඇයි......?

- රසායනික නිසා සිදුවිය හැකි අනතුරු හා රෝග වළක්වා ගැනීමට
- අපරීක්ෂාකාරී භාවිතය නිසා පරිසරයට වන හානි වළක්වා ගැනීමට







ඔබ භාවිතා කරන කෘමිනාශක, පළිබෝධනාශක හෝ පොහොර වල ඇති රසායනික ඔබගේ,

- මුඛයෙන්
- නාසයෙන්
- සම තුළින්

ශරිරයට ඇතුල්විය හැකිය.

ඒවාට,

- ඔබ නිරාවරණය වන කාලය
- භාවිතා කරන ද්‍රවයේ රසායනික අඩංගු වන ප්‍රමාණය
- රසායනිකයේ වර්ගය

අනුව සිදුවන හානිය තීරණය වේ.



↑ Skin problems caused by pesticide exposure.




## ඔබ විසින් කළ යුතු දෑ.....

- අහිතකර රසායන අඩංගු කෘමිනාශක හා පළිබෝධනාශක භාවිතයෙන් හැකිතාක් දුරට වැළකෙන්න.

- නිෂ්පාදකයා විසින් සපයා ඇති බෝතල් හෝ බහාලුම් වල සඳහන් තොරතුරු කියවා අඩංගු වන රසායනික පිළිබද හා ආරක්ෂිත භාවිතය ගැන දැන ගන්න.






- ආරක්ෂිතව ගබඩා කර තබන්න.

- මේවා හා ගැටෙන කාල සීමාව හැකිතාක් දුරට අඩු කරන්න.
- මේවා භාවිතා කිරිමේදී නිවැරදි ආරක්ෂිත උපකරණ පළඳින්න.





- රසායනික සහිත කෘමිනාශක, පළිබෝධනාශක, පොහොර, භාවිතා කරන අතරතුර, ආහාර ගැනීමෙන්, දුම්පානයෙන්, බුලත් විට හැපීමෙන්, බීම වර්ග පානයෙන් වළකින්න.



- ශරීරයේ තුවාල, කැපීම් වැනි තත්ව තිබියදී මේවා භාවිතා කිරීමෙන් වළකින්න.






- සුළඟ වැඩි දිනවලදී සුළඟේ දිශාවට මුහුණලා මේවා ඉසීමෙන් වළකින්න.

- භාවිතා කිරීමෙන් අනතුරුව ශරීරය පිරිසිදු ජලයෙන් සෝදා පිරිසිදු කරන්න.

- හදිසි විස වීමකදී, ඇස්වල හෝ සමේ හෝ තැවරීමකදී ලබා දිය යුතු ප්‍රථමාධාර ගැන දැනුවත් වන්න. එවැනි අවස්ථාවක ඉක්මනින් වෛද්‍ය ප්‍රතිකාර සදහා යොමු කරන්න.

- භාවිතා කිරීමෙන් පසු ඉතිරිවන හිස් බදුන් ජලාශ හෝ වෙනත් ජල මූලාශ්‍ර වලට විසි කරීමෙන් වළකින්න.



**සිහි තබා ගන්න**

- සෑම විටම නිවැරදි ක්‍රියාකාරකම්
- හොඳ සෞඛ්‍ය පුරුදු
- ඉක්මන් ප්‍රථමාධාර
- විධිමත් කසල බැහැර කිරීම මගින්

ඔබගේත් සෙසු අයගේත් ජීවිත අකාලයේ රසායන වලට ගොදුරු වීම වළක්වා ගත හැකිය.

මෙය ඔබගේ වගකීමකි. සෞඛ්‍ය ආරක්ෂිත සමාජයක් සඳහා සෙසු අයටත් මේ පණිවිඩය ලබා දී ඔවුන් දැනුවත් කරමු !!

**සුරක්ෂිත සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක්**
**වෙනුවෙන් .....**
**කම්කරු දෙපාර්තමේන්තුවේ**
**"කර්මාන්තමය සුරක්ෂිතතා" අංශයේ**
**පණිවිඩයකි .................**

**අපගේ ලිපිනය**

**කම්කරු කොමසාරිස්**
**(කර්මාන්තමය සුරක්ෂිතතා ) හා**
**ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු**
**කර්මාන්තමය සුරක්ෂිතතා අංශය,**

**97, ජාවත්ත පාර, කොළඹ 05.**

**011-2508783**